www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ජනාධිපතිවරන උද්ඝෝෂනය දියත් කිරීමට ශ්‍රී ලංකාවේ සසප යේ ප්‍රසිද්ධ රැස්වීම

**Sri Lankan SEP public meeting to launch presidential campaign**

2009 දෙසැම්බර් 09

සමාජවාදී සමානතා පක්ෂය (සසප) ජනවාරි 26 වනදා ජනාධිපතිවරනයට සිය උද්ඝෝෂනය දියත් කිරීම සඳහා දෙසැම්බර් 12 දා කොලඹ දී ප්‍රසිද්ධ රැස්වීමක් පවත්වනු ලබයි. සසප ප්‍රධන ලේකම් සහ ලෝක සමාජවාදී වෙබ් අඩවියේ ජාත්‍යන්තර කර්තෘ මන්ඩල සමාජික විජේ ඩයස් එහි අපේක්ෂකයා ලෙස ඉදිරිපත් වේ.

දෙමල ඊලම් විමුක්ති කොටි සංවිධානය (එල්ටීටීඊ) යුදමය වශයෙන් පරාජය කිරීමේ වාසිය ඩැහැගැනීමේ මංමුලා සහගත ප්‍රයත්නයක් ලෙස ජනාධිපති මහින්ද රාජපක්ෂ මෙම මැතිවරනය කලින් ම කැඳවුම් කලේ ය. පසුගිය මාසය දක්වා ආරක්ෂක මාන්ඩලික ප්‍රධානී ලෙස සිට සහ වාර්ගික යුද්ධය සහ ඊට සම්බන්ධ අපරාධවලට රාජපක්ෂ සමග ම වගකීම දරන, ජෙනරාල් සරත් ෆොන්සේකා හට විරුද්ධ පක්ෂ සහයෝගය දී ඇත.

කුමන අපේක්ෂකයා ජයග්‍රහනය කල ද, දිවයිනේ දරුනු ආර්ථික අර්බුදයේ බර කම්කරු ජනතාව මත පැටවීමට මීලඟ ආන්ඩුව වේගයෙන් හැරී ගනු ඇත. දෙමල සුලුතරයට එරෙහිව කුරිරු ලෙස යුද්ධය ගෙන යාමෙන් පසුව, රැකියා සහ ජීවන තත්වයන්ට තවදුරටත් එල්ල වන ප්‍රහාරයන්ට එරෙහිව නැගෙන කුමන හෝ විරුද්ධත්වයක් මර්දනය කිරීමට පොලිස් රාජ්‍ය පියවරයන් පාවිච්චි කිරීමට රාජපක්ෂ සහ ෆොන්සේකා දෙදෙනාම සූදානමින් සිටී.

සමාජවාදී ප්‍රතිපත්තීන් ක්‍රියාවේ යොදවන කම්කරුවන්ගේ සහ ගොවියන්ගේ ආන්ඩුවක් සඳහා කම්කරු පන්තිය ස්වාධීනව බලමුලුගැන්වීමේ අරගලය සඳහා උද්ඝෝෂනය කරනු ලබන්නේ සසප පමනි. දකුනු ආසියාව පුරාත් ජාත්‍යන්තරවත් සමාජවාදය සඳහා අරගලය අපගේ උද්ඝෝෂනයේ අත්‍යාවශ්‍ය මූලිකාංගයකි. කම්කරුවන්ගෙන්, තරුනයන්ගෙන්, හිතනමතන බුද්ධිමතුන්ගෙන් සහ ලෝසවෙඅ කියවන පාඨකයන්ගෙන් අපගේ රැස්වීමට සහභාගීවන ලෙස අපි උදක්ම ඉල්ලා සිටිමු.

**ස්ථානය : නාරායනගුරු ශාලාව (ආමර් වීදිය අසල), කොලඹ 12.**

**වේලාව: දෙසැම්බර් 12 සෙනසුරාදා, සවස 3.00 ට**

© www.wsws.org